**File No: ………………………..** **REC/F/95(M)**

**ඇප බැඳුම්කරය** (නිෂ්පාදන සහ ඉදිකිරීම්)

1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතින් සංස්ථාපනය කරන ලද ස්වකීය ලියාපදිංචි ගත කාර්යාලය බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත අංක 234 හි පිහිටි (මෙහි මින් මතු කාර්යාංශය යයි සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (කාර්යාංශයෙහි අනුප්‍රාප්තිකයන් හා අද්මිනිස්ත්‍රාසිකරුවන් ද ඇතුළත්ව) **පළමු වන පාර්ශ්වයට** ද,

සහ,

මෙම ඇප බැඳුම්කරයේ මතු පළමු සහ දෙවන ඇපකරුවන් ලෙස හඳුන්වනු ලබන පහත සඳහන් තැනැත්තන් සහ මින් මතු පොදුවේ එකී ඇපකරුවන් **දෙවන පාර්ශ්වය** ලෙස ද හඳුන්වන,

<u>පළමු ඇපකරු ලෙස</u>

…………………………………………[1] ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ ……………………………… [2]

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ………………………………………………………………………

……………………………………………………………………………………………………[3]

ලිපිනයෙහි පදිංචි (ජා.හැ.අං.……………………………………………[4]) හිමි …………………………

……………………………………………………………………………………………[5]ද ,

<u>දෙවන ඇපකරු ලෙස</u>

…………………………………………[6] ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ ……………………………… [7]

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ………………………………………………………………………

……………………………………………………………………………………………………[8]

ලිපිනයෙ හි පදිංචි (ජා.හැ.අං.……………………………………………[9]) හිමි …………………………

……………………………………………………………………………………………[10]ද,

යන දෙවන පාර්ශ්වයේ උරුමකාර, පොල්ම:කාර සහ අද්මිනිස්ත්‍රාසිකාර, බලකාර හෝ ලැබුම්කාර ආදීන් අනෙක් පක්ෂයට ද බැඳී පහත සඳහන් පොරොන්දු ගිවිසිලිවලට එකඟව ………………………………… [11] දින බත්තරමුල්ලහිදී ස්වකැමැත්තෙන් ඇතුලත් වන්නට යෙදුන ඇප ගිවිසුමේ වග නම්,

1. මෙහි මින්මතු සේවා නියුක්තිකයා යැයි කියනු ලබන .................................................................................................... ........................................................[12] ලිපිනයෙහි පදිංචි ............................. ....................................................................................................[13] (ජා.හැ.අං........................................ [14]) යන අය දකුණු කොරියානු රාජ්‍යයේ ..................................................................[15] ආයතනයෙහි මාස ........ [16] කාලයක් සඳහා කම්කරු තනතුරෙහි (මින් මතු විදේශ රැකියාව ලෙස හඳුන්වනු ලබන) සේවකයෙකු වශයෙන් සේවය කිරීමට ..................................... [17] දින ගිවිසගෙන (කොරියානු රැකියා ගිවිසුම) සිටින බවත් පළමු පාර්ශ්වය මගින් එම රැකියාව ලබා ගෙන ඇති බවත් සේවා නියුක්තිකයා පළමු පාර්ශ්වය සමග ................................ **[18]** දින එම විදේශ රැකියාව ලබාගැනීම සඳහා බත්තරමුල්ලේ දී ගිවිසුමකට (මින් මතු "රැකියා ගිවිසුම" ලෙස හඳුන්වනු ලබන) එළඹ ඇති බවත් පාර්ශ්වයන් පිළිගනු ලබයි.

2. සේවා නියුක්තිකයා රැකියා ගිවිසුම අනුව කටයුතු කිරිමට බැඳී ඇති බැවින් සහ එකී රැකියා ගිවිසුමෙහි කාර්යය සාධනයෙහිලා මෙන්ම එකී රැකියා ගිවිසුම යථා පරිදි ඉටු කිරීමට සේවා නියුක්තිකයාට ඇති වගකීම තහවුරු කරනු පිණිස ඇපකරුවන් වීමට ස්වකැමැත්තෙන් දෙවන පාර්ශ්වය බන්ධදායකයන්ව ඇති බවට පාර්ශ්වයන්ගේ එකඟතාවය මගින් මෙසේ සාක්ෂි දරණ බව සියල්ලන් විසින්ම දැනගත යුතුය. මෙම ඇප බැඳුම්කරය සේවා නියුක්තිකයා විසින් සේවා ගිවිසුම දීර්ඝ කරගනු ලැබුවහොත් එසේ දීර්ඝ කරගනු ලබන අවසන් කාලය දක්වා වලංගුවන බවට දෙවන පාර්ශ්වය එකඟ වේ.

3. කොරියානු රැකියා ගිවිසුමට අනුව අදාළ කාල සීමාව සම්පූර්ණ කිරීමෙන් පසු හෝ රැකියා ගිවිසුමේ නියමයන් අනුව සේවය අවසන් කිරීමෙන් පසු සේවා නියුක්තිකයා වහාම ශ්‍රී ලංකාවට පැමිණිය යුතු අතර එසේ පැමිණ සති දෙකක කාලයක් ඇතුළත මෙහි පළමු පාර්ශ්වය වෙත වාර්තා කළ යුතුය. සේවා නියුක්තිකයා විසින් කොරියානු රැකියා ගිවිසුමට අනුව ක්‍රියා කල යුතු අතර එකී කොරියානු රැකියා ගිවිසුම කඩවන ආකාරයට කිසියම් වු අවස්ථාවක ක්‍රියා නොකළ යුතුය.

4. සේවා නියුක්තිකයා වෙනුවෙන් ඇපකරුවන් වීමට දෙවන පාර්ශ්වය එකඟ වී ඇති බැවින් සේවා නියුක්තිකයා විසින් එකී කොරියානු රැකියා ගිවිසුම/ රැකියා ගිවිසුම කඩවන ආකාරයට කිසියම් වු

අවස්ථාවක ක්‍රියා කර ඇත්නම් ශ්‍රී ලංකා රුපියල් මිලියන දෙකක **(රු.2,000,000/-)** මුදලක් පළමු පාර්ශ්වය ඉල්ලා සිටි විටකදී පළමු පාර්ශ්වය වෙත ඉල්ලා සිටි දිනට එකවර නොපමාව ගෙවීම පිණිස දෙවන පාර්ශ්වය බන්ධනය වී ඇති බවත් එම ගෙවීම උදෙසා ඇපකරුවන්ගේ උරුමකරුවන් අද්මිනිස්ත්‍රාසිකරුවන් සහ පොල්ම:ක්කරුවන් වෙනුවෙන්ද මෙම ලියවිල්ල මගින් එක්ව සහ වෙන් වෙන්ව බන්ධනය වි සිටින බවත් දෙපාර්ශ්වය පිළිගනු ලබයි.

5. සේවා නියුක්තිකයා විසින් එකී කොරියානු රැකියා ගිවිසුම/රැකියා ගිවිසුම කඩවන ආකාරයට කිසියම් වූ අවස්ථාවක ක්‍රියා කර ඇත්නම් එකී ඇප මුදල වන රුපියල් මිලියන දෙකක **(රු.2,000,000/-)** මුදල ඇපකරුවන්ගෙන් එක්ව හෝ වෙන් වෙන්ව පළමු පාර්ශ්වයට අයකර ගැනීමට සම්පූර්ණ නෛතික හිමිකමක් හා බලයක් ඇති බැව් දෙපාර්ශ්වය පිලිගනී.

6. මෙම ඇප බැඳුම්කරය සම්බන්ධයෙන් නිසි අධිකරණ බලය කඩුවෙල දිසා අධිකරණය විය යුතු බව දෙපාර්ශ්වය විසින් පිළිගනු ලැබේ.

7. මෙම බැඳුම්කරයේ කාර්යයන් වෙනුවෙන් සියළුම දැනුම්දීම් සඳහා දෙවන පාර්ශ්වයේ ඉහත දක්වා ඇති ලිපිනයන් ස්ථිර ලිපිනයන් ලෙස පිළිගනු ලබන අතර එම ලිපිනයන්ට ලිපි, සිතාසි හා නොතීසි භාරදීම වලංගු හා නිසි භාරදීමක් බව දෙපාර්ශ්වය විසින් පිළිගනු ලබයි.

8 තවද ඇපකරුවන් විසින් පිළිවෙලින් අයකර ගැනීමේ වාසිය සහ බෙදා ගෙවීමේ වාසිය (beneficium ordinis seu excussionis et divisionis) ද ඇප කරුවන්ගේ තත්වයෙන් නීතියෙන් ඇපකරුවන්ට හිමි වෙනත් සියළු වාසි, වරප්‍රසාද සහ ව්‍යතිරේකද මෙයින් අත්හැර දමන්නෙමු. ඒ අත්හැර දැමීමේ බලපෑම් සහ බලාත්මකභාවය අපට පැහැදිලි කරදෙන ලදී. එසේම ඒ කාරණය සම්බන්ධයෙන් අප පූර්ණ වශයෙන්ම දැනුවත්ව සිටින බවද ඇප කරුවන් වන අප මෙයින් ප්‍රකාශ කර සිටිමු.

9. රැකියා ගිවිසුම කිසියම් අවස්ථාවකදී සේවා නියුක්තිකයා විසින් උල්ලංඝනය කල හොත්, රැකියා ගිවිසුමට අනුව එකඟ වූ රැකියා ස්ථානය අතහැර ගියහොත්, ශ්‍රී ලංකාවේ කීර්ති නාමයට බලවත් හානියක් සිදුවන බවටත් පළමු පාර්ශවයේ මහජන සේවා කටයුතු සඳහා බලවත් අගතියක් සිදු වන බවටත් ශ්‍රී ලංකාවේ රැකියා අපේක්ෂකයින්ට අනාගතයේ දී විදේශ රැකියාවන් ලබාගැනීමේ දී අහිතකර තත්වයක් උද්ගත විය හැකි බවටත් රැකියා ගිවිසුම පදනම් වූ රැකියාවේ වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන දෙකක **(රු.2,000,000/-)** මුදලක් වන බවටත් මනා අවබෝධයකින් යුතුව ස්වකැමැත්තෙන් මෙහි ඇප කරුවන්ව ඇති බවට දෙවන පාර්ශ්වය විසින් මෙයින් වැඩිදුරටත් පිළිගනු ලබයි.

ඉහත පළමු පාර්ශ්වය සහ දෙවන පාර්ශ්වය ඉහත සියලු ප්‍රකාශයන්ට එකඟව වගකීම් මැනවින් අවබෝධ කරගත් බැවින් ඉහත සියලු ප්‍රකාශයන්ට නියමිත වගකීම් භාරගැනීම සඳහා බත්තරමුල්ලේ දී පහත අත්සන් තබන ලදී.

**<u>පළමු පාර්ශ්වය</u>**

...........................................................
තනතුර:-නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(පුහුණු) / කළමනාකරු බඳවාගැනීම් (කොරියානු) අංශය
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**<u>දෙවන පාර්ශ්වය</u>**

...................................... ..........................................

**පළමු ඇපකරු (අත්සන)** දෙවන ඇපකරු **(අත්සන)**

**<u>සාක්ෂි</u>**

1. ………………………………………………….................. ……..………
2. ……………………………………….…………………..…..... …….............
(නම, ජාතික හැඳුනුම්පත් අංකය) **(අත්සන)**

මෙම ඇප බැඳුම්කරයේ අඩංගු කරුණු මා විසින් මෙහි සඳහන් සියලු පාර්ශ්වයන්ට කියවා පැහැදිලි කර දුන් පසු එම කරුණු තේරුම්ගෙන මා ඉදිරියේ දී මෙම ලියවිල්ලට හා මෙම ලියවිල්ල හා සමාන පිටපතකටත් ඔවුනොවුන් විසින් .................................. දින දී බත්තරමුල්ලේ දී අත්සන් තබන ලද බවට මෙයින් සහතික කරමි.

**නීතිඥ**